# මරණය පිළිබඳ ගැටළුව සහ බුදුසමය

ඩෙන්සිල් සේනාධීර

## හැඳින්වීම

මරණය පිළිබඳ ධර්මතාව හෙවත් සංසිද්ධිය සම්බන්ධයෙන් ව්‍යක්ත විග්‍රහයක් අභිධර්මප්‍රකරණයන්හි ද පශ්චාත්කාලීන අටුවාග්‍රන්ථවලද අන්තර්ගත වන බව දක්නට ලැබෙන නමුත් ඒ සම්බන්ධයෙන් විස්තරාත්මක විග්‍රහයක් ඉදිරිපත්කිරීමට බුදුහිමියන් යුහුසුලු වී ඇතිබවක් සූත්‍ර පිටකය තුළින් විද්‍යමාන නොවේ. මිනිසෙකු මියයාම ප්‍රශ්නයට පත්විය යුතු කරුණක් නොවන බව උන්වහන්සේ ප්‍රකාශකළහ[1] උන්වහන්සේගේ අභිප්‍රාය වූයේ මනුෂ්‍ය ජීවිතයේ පවත්නා ප්‍රායෝගික ගැටළු සහ ඒවායේ මුල හෙළිදරව්වෙන් එම ගැටළු නිරවුල් කෙරෙන මග ලෝකයාට පැහැදිලි කර දීම මිස මරණය වැනි ස්වභාවික ක්‍රියාදාම සම්බන්ධයෙන් තාක්ෂණික විග්‍රහ ඉදිරිපත්කිරීම නොවේ. සම්බුදුවහන්සේ විසින් අවධාරණය කරණු ලබන්නේ දුක සහ දුකින් මිදීම යන කරුණු ම බව උන්වහන්සේ නොයෙක් විට ප්‍රකාශ කළහ.[2] ඒ අනුව මරණය නමැති සංසිද්ධිය සම්බන්ධයෙන් කෙරෙන විස්තරයකට වඩා එම සිද්ධිය පදනම් කරගෙන මිනිසා මුහුණ දෙන ගැටළු සහ ඒවාට විසඳුම් පැහැදිලි කිරීමට උන්වහන්සේ යොමුවූ බව පෙනේ.

## මරණය පිළිබඳ ගැටළුව

මරණය සෑම සත්වයෙකුට ම නියත වශයෙන්ම මුහුණ පෑමට සිදුවන අත්දැකීමකි. එහෙත් එම ස්වභාවික අත්දැකීමට මුහුණ දීමට සියළු ම සත්වයෝ බිය පවති[3]. මරණය මගහරවා ගතහැකි ආරක්ෂිත ස්ථානයක් ද ලොව කිසිදු තැනෙක නොමැත[4]. මරණයේ දී සිදුවන්නේ කුමක්දැයි නිශ්චිතව කීමට අප නොදන්නා නමුත් මිය යාමේදී අපගේ ශරීරය අවිඥ්ඥාණකව වැඩිනට